දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
உள்நாட்டு இறைவரித் திணைக்களம்
INLAND REVENUE DEPARTMENT

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338635

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135300/ 2135410/ 2135412 / 2135413

E-Mail -tpl@ird.gov.lk / itp@ird.gov.lk
Web: www.ird.gov.lk

චක්‍රලේඛ අංකය: SEC/2026/E/06 (සංශෝධනය කරන ලද චක්‍රලේඛය) **2026 අගෝස්තු 12**

බදු ගෙවන්නන් සඳහා වන චක්‍රලේඛය

කාර්තුමය ආදායම් බදු වාරික ගණනය කිරීම පිළිබඳ චක්‍රලේඛය [2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (සංශෝධිත) 90 වන වගන්තිය]

අදාළ කාලසීමාව: 2026/2027 තක්සේරු වර්ෂය

මෙම චක්‍රලේඛය මඟින් 2026/2027 තක්සේරු වර්ෂය සඳහා අදාළ කාර්තුමය ආදායම් බදු වාරික ගෙවිය යුතු මුදල ගණනය කිරීමේ ක්‍රමවේදය සහ ඒ සම්බන්ධ ක්‍රියාපටිපාටිය දක්වා ඇත. මෙම චක්‍රලේඛය 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (සංශෝධිත) 90 වන වගන්තියේ (3) වන උපවගන්තියට අනුකූලව නිකුත් කර ඇත.

බදු ගෙවන්නන්ගේ ඉල්ලීම මත මුල් චක්‍රලේඛයට යම් යම් සංශෝධන සිදු කර ඇත. සංශෝධිත චක්‍රලේඛයේ සිදු කරන ලද සංශෝධන ඉස්මතු කර දක්වා ඇත.

බදු ගෙවන්නන්ගේ පහසුව සඳහා ගෙවීම් සිදුකිරීම පිළිබඳ උපදෙස් වෙනමම නිකුත් කරනු ලැබේ.

1. නියමිත ගෙවීම් දින සහ කාර්තුමය ආදායම් බදු වාරික ගණනය කිරීමේ සූත්‍රය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 90 වන වගන්තිය අනුව, වාරික වශයෙන් බදු ගෙවීමට බැඳී සිටින තැනැත්තකු විසින් අදාල තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය බදු වාරික පහත සඳහන් දිනවල හෝ ඊට පෙර ගෙවිය යුතුය.

පළමු වාරිකය: තක්සේරු වර්ෂයේ අගෝස්තු 15 වන දිනට හෝ ඊට පෙර
දෙවන වාරිකය: තක්සේරු වර්ෂයේ නොවැම්බර් 15 වන දිනට හෝ ඊට පෙර
තෙවන වාරිකය: තක්සේරු වර්ෂයේ පෙබරවාරි 15 වන දිනට හෝ ඊට පෙර
සිව්වන වාරිකය: ඊළඟ තක්සේරු වර්ෂයේ මැයි 15 වන දිනට හෝ ඊට පෙර

කාර්තුමය ආදායම් බදු වාරික ගණනය කිරීමේ සූත්‍රය

2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 90(3) වගන්තිය අනුව, එක් එක් වාරිකය සඳහා ගෙවිය යුතු ආදායම් බදු මුදල ගණනය කිරීම සඳහා පහත සූත්‍රය අදාළ වේ.

$$\frac{A - C}{B}$$

www.ird.gov.lk www.facebook.com/irdcolsl/

මෙහි,

A = පූර්ව තක්සේරු වර්ෂය සඳහා බදු ගෙවන්නාගේ බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු බදු මුදල (කිසියම් බදු බැරක් අඩු කිරීමට පෙර වන දළ ආදායම් බදු මුදල).

B = වත්මන් වාරිකය ඇතුළුව තක්සේරු වර්ෂයේ ඉතිරිව ඇති වාරික සංඛ්‍යාව.

ඒ අනුව,

පළමු වාරිකය: **B = 4**
දෙවන වාරිකය: **B = 3**
තෙවන වාරිකය: **B = 2**
සිව්වන වාරිකය: **B = 1**

C = තක්සේරු වර්ෂය තුළ, අදාළ වාරිකය ගෙවිය යුතු දිනට පෙර ගෙවා ඇති මුළු බදු මුදලයි. මේ සඳහා, තක්සේරු වර්ෂය තුළ පෙර ගෙවූ වාරික, රඳවා ගනු ලැබූ හෝ රඳවා ගැනීමට නියමිත රඳවා ගැනීමේ බදු (**WHT**) **/** අත්තිකාරම් ආදායම් බදු (**AIT**) බැර ඇතුළත් වේ.

2. "A" සංරචකය තීරණය කිරීමේ ක්‍රමවේදය

ඉහත සූත්‍රයේ "**A**" සංරචකය විවිධ අවස්ථාවලදී ගණනය කරන ආකාරය පහත දැක්වේ.

පලමු ක්‍රමය : සාමාන්‍ය පදනම (2025/2026 තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායමක් ඇති බදු ගෙවන්නන්)

සියලුම බදු ගෙවන්නන් සඳහා, **"A"** යනු අදාල තක්සේරු වර්ෂයට පෙරාතුවම තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායම සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු මුදලයි.

උදාහරණයක් ලෙස, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා "A" ගණනය කරන්නේ නම්, පෙරාතුවම තක්සේරු තක්සේරු වර්ෂය වන්නේ 2025/2026 තක්සේරු වර්ෂය වන අතර, එම වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත අදාළ බදු අනුපාත අදාල කර ගැනීමෙන් ගණනය වන බදු මුදල "**A**" ලෙස සැලකේ.

උදාහරණය 1:
එක්ස් මහතා පරිගනක දෘඩාංග (Hardware) වෙළඳසැලක් පවත්වාගෙන යයි. 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායම රු. 3,800,000 කි.

ඒ අනුව, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ දළ ආදායම් බදු වගකීම (Gross Income Tax Liability) පහත පරිදි වේ.

විස්තරය	**මුදල (රු.)**
මුළු තක්සේරු කළ හැකි ආදායම	3,800,000
අඩු කලා: පුද්ගලික සහනය	(1,800,000)
බදු අය කළ හැකි ආදායම	**2,000,000**

ගෙවිය යුතු දළ ආදායම් බද්ද පළමු රු 1,000,000 @ 6% = 60,000 ඊළඟ රු 500,000 @ 18% = 90,000 ඊළඟ රු 500,000 @ 24% = 120,000 මුළු දළ බද්ද = 270,000	

එබැවින්, ඉහත සූත්‍රයේ 'A' යන්නෙන් අදහස් වන්නේ රු 270,000 කි. 2026/2027 තක්සේරු වර්ෂය සඳහා ඔහුට කිසිදු රඳවා ගැනීමේ බදු බැරක් (Withholding Tax Credits) නොමැති නම්, ඔහුගේ පළමු කාර්තු වාරික ගෙවීම පහත පරිදි වේ.

$$\frac{A - C}{B} \qquad \frac{270{,}000 - 0}{4} = \text{රු}.\ 67{,}500$$

එබැවින්, එක්ස් මහතා 2026/2027 තක්සේරු වර්ෂය සඳහා වන පළමු කාර්තුමය ආදායම් බදු වාරිකය ලෙස රු 67,500 ක් 2026 අගෝස්තු 15 වන දින හෝ එදිනට පෙර ගෙවිය යුතුය.

උදාහරණය 2:

2025/2026 තක්සේරු වර්ෂය සඳහා ලිකර් පුද්ගලික සමාගමේ පහත සඳහන් බදු ගණනය කිරීම ඉදිරිපත් කර ඇත. එම සමාගම දේශීය වෙළඳපොළ සඳහා මත්පැන් නිෂ්පාදනය කිරීමේ කාර්යයේ නිරත වී ඇත.

විස්තරය	**මුදල (රු.)**
ව්‍යාපාර ආදායම – නිෂ්පාදනය කරන ලද මත්පැන් අලෙවියෙන් ලැබූ ආදායම	1,650,000
ආයෝජන ආදායම	6,000
මුළු තක්සේරු කළ හැකි ආදායම	1,656,000
අඩු කළා: සුදුසුකම් ලබන ගෙවීම් (Qualifying Payment)	(3,000)
බදු අය කළ හැකි ආදායම	**1,653,000**
ගෙවිය යුතු දළ ආදායම් බද්ද මත්පැන් නිෂ්පාදන නිෂ්පාදනය කර අලෙවියෙන් ලැබූ ලාභ හා ආදායම මත: = රු 1,647,000 @ 45% =741,150 ආයෝජන ආදායම මත: රු 6,000 @ 30% = 1,800 මුළු දළ බද්ද රු = 742,950	

ඒ අනුව, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා ඉහත සූත්‍රයේ 'A' හි අගය රු 742,950,000 ක් වේ.

2026/2027 තක්සේරු වර්ෂය සඳහා සමාගමට රු 880,000ක රඳවා ගැනීමේ බදු බැර (Withholding Tax Credits) හෝ අත්තිකාරම් ආදායම් බදු බැර (Advance Income Tax – AIT Credits) හිමිකම් තිබේ නම්, පළමු කාර්තුවේ වාරික ගෙවීම පහත පරිදි ගණනය කරනු ලැබේ.

www.ird.gov.lk https://www.facebook.com/irdcolsl/

$$\frac{A - C}{B} \qquad \frac{742,950,000 - 880,000}{4} = රු.\ 185,517,500$$

එබැවින්, ලිකර් පුද්ගලික සමාගම 2026/2027 තක්සේරු වර්ෂය සඳහා වන පළමු කාර්තුමය ආදායම් බදු වාරිකය ලෙස රු. 185,517,500 ක් 2026 අගෝස්තු 15 දින හෝ එදිනට පෙර ගෙවිය යුතුය.

අනුකූලතා සටහන (Compliance Note):

1. මෙම සම්මත පදනම (Standard Basis) යටතේ සිදු කරන ගෙවීම් සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.
2. මෙම සම්මත ගණනය කිරීම් මත ගෙවිය යුතු මුදලට වඩා අඩුවෙන් ගෙවීම් කර ඇති විට, හෝ ප්‍රමාද වී ගෙවීම් කර ඇති විට හෝ කිසිදු ගෙවීමක් සිදු නොකර ඇති විට, ඒ සඳහා පොලී සහ දඩ මුදල් අය කෙරේ.
3. ඔබ කාර්තු වාරික ගණනය කිරීම සඳහා සම්මත ක්‍රමය භාවිතා කිරීමට සුදුසුකම් ලබන්නේ නම්, පහත සඳහන් විකල්ප ක්‍රම භාවිතා කළ නොහැක.

දෙවැනි ක්‍රමය: විකල්ප පදනම් (ආදායමක් නොමැති අවස්ථා / අපේක්ෂිත ආදායම අඩු අවස්ථා)

විකල්ප ක්‍රම භාවිතා කළ හැක්කේ පහත සඳහන් කොන්දේසිවලින් එකක් සපුරාලන බදු ගෙවන්නන් සඳහා පමණි:

- **2025/2026 තක්සේරු වර්ෂය සඳහා බදු වගකීමක් නොමැති වීම:** අදාල තක්සේරු වර්ෂයට පෙරාතුවම තක්සේරු වර්ෂයේ (2025/2026) බදු අය කළ හැකි ආදායමක් නොතිබීම.
- **අපේක්ෂිත අඩු ආදායම:** වත්මන් තක්සේරු වර්ෂයේ (2026/2027) බදු අය කළ හැකි ආදායම පෙරාතුවම තක්සේරු වර්ෂයට (2025/2026) වඩා අඩු වනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කිරීම.

(අ) 2025/2026 තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායමක් නොමැති අතර 2026/2027 තක්සේරු වර්ෂයේ ද බදු අය කළ හැකි ආදායමක් අපේක්ෂා නොකරන අවස්ථා

බදු ගෙවන්නෙකුට 2025/2026 තක්සේරු වර්ෂයේදී බදු අය කළ හැකි ආදායමක් නොමැති අතර, 2026/2027 තක්සේරු වර්ෂය සඳහාද තක්සේරු කළ හැකි ආදායමක් අපේක්ෂා නොකරන්නේ නම් (උදා: අඩු කළ හැකි විශාල පාඩු පැවතීම හේතුවෙන්), සූත්‍රයේ 'A' අගය **ශූන්‍ය (0) ලෙස සලකනු ලැබිය හැක**.

අවශ්‍යතාවය: කිසිදු වාරික ගෙවීමක් සිදු කිරීමට අවශ්‍ය නොවන නමුත්, බදු ගෙවන්නා විසින් ඇමුණුම 1 හි සඳහන් ආකාරයට ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය (ඇමුණුම 1 හි 6 වන ඡේදය සහ 8.2 ඡේදය).

(ආ) 2025/2026 තක්සේරු වර්ෂයේදී බදු අය කළ හැකි ආදායමක් නොමැති නමුත් 2026/2027 තක්සේරු වර්ෂයේදී බදු අය කළ හැකි ආදායමක් අපේක්ෂා කරන අවස්ථා

www.ird.gov.lk https://www.facebook.com/irdcolsl/

පෙර තක්සේරු වර්ෂවල දරන ලද අඩු කළ හැකි පාඩු අවසන් වීම හෝ අඩු වීම (දේශීය ආදායම් පනත යටතේ අවසර දී ඇති පරිදි), හෝ 2025/2026 තක්සේරු වර්ෂයේදී අදාළ වූ බදු නිදහස් කිරීම් 2026/2027 තක්සේරු වර්ෂයේදී අදාළ නොවීම වැනි හේතු නිසා යම් තැනැත්තෙකුට 2025/2026 තක්සේරු වර්ෂයේදී බදු අය කළ හැකි ආදායමක් නොතිබුණද, 2026/2027 තක්සේරු වර්ෂයේදී බදු අය කළ හැකි ආදායමක් ලබනු ඇතැයි අපේක්ෂා කරන්නේ නම්, එවැනි අවස්ථාවලදී, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු දළ ආදායම් බද්ද ඇස්තමේන්තු කළ යුතුය.

මෙහිදී, 2026/2027 තක්සේරු වර්ෂයේ බදු ගෙවිය යුතු මුදල 2025/2026 තක්සේරු වර්ෂයේ සංඛ්‍යාලේඛන මත පදනම්ව ඇස්තමේන්තු කළ යුතුය. සූත්‍රයේ 'A' අගය ගණනය කිරීමේදී, 2025/2026 තක්සේරු වර්ෂයේ බදු අය කළ හැකි ආදායමට අදාල බදු නීතිය සහ දේශීය ආදායම් පනතේ පළමු උපලේඛනයේ (First Schedule) සඳහන් ආදායම් බදු අනුපාත අදාල කර ගත යුතු අතර, එම වර්ෂයේදී අඩු කරන ලද පාඩු හෝ ලබා දුන් බදු නිදහස් කිරීම් නොසලකා හැරිය යුතුය.

ඉහත පරිදි ගණනය කිරීම් සඳහා 2025/2026 තක්සේරු වර්ෂය සඳහා බදු ගණනය කිරීම පළමු වාරිකය ගෙවිය යුතු දිනය වන විට අවසන් කර නොමැති අවස්ථාවක, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා පළමු කාර්තුමය වාරිකය සඳහා ගෙවිය යුතු බද්ද ගණනය කිරීමේදී, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා වන අවසන් ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය (SET) භාවිත කළ හැක. කෙසේ වෙතත්, 2 වන කාර්තුමය වාරිකය සඳහා මෙය 2025/2026 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වාර්තාව මත පදනම් වන පරිදි සංශෝධනය කළ යුතුය.

මෙම බදු ගෙවන්නන් ඇමුණුම 1 හි දක්වා ඇති පරිදි ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. පළමු කාර්තුව සඳහා SET පදනම භාවිත කළ බදු ගෙවන්නන්, පළමු කාර්තුව සඳහා ඇමුණුම 1 ද, දෙවන කාර්තුව සහ ඉන් පසු කාර්තු සඳහා ඇමුණුම 1 (සංශෝධිත) ද ඉදිරිපත් කළ යුතු අතර, එක් සංශෝධනයක් පමණක් සිදු කිරීමට අවසර ඇත.

උදාහරණය 3: අඩු කළ හැකි පාඩු අවසන් වීම – ඒබීසී පුද්ගලික සමාගම

2025/2026 තක්සේරු වර්ෂය සඳහා ඒබීසී පුද්ගලික සමාගමේ බදු ගණනය කිරීම පහත පරිදි වේ. මෙම සමාගම දේශීය වෙළඳපොළ සඳහා බිස්කට් නිෂ්පාදනය කිරීමේ කාර්යයේ නිරත වේ. 2024/2025 තක්සේරු වර්ෂය අවසානය වන විට, සමාගමට ඊළඟ තක්සේරු වර්ෂයට ඉදිරියට ගෙන යා හැකි හිලව් නොකල පාඩු (Unrelieved Losses) රු. 526,000 ක් තිබුණි. මෙම පාඩු 2022/2023 තක්සේරු වර්ෂය තුළ ඇති වූ අතර, දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ අඩු කිරීමට අවසර ඇත.

2025/2026 තක්සේරු වර්ෂය සඳහා වන බදු ගණනය කිරීම පහත දැක්වේ.

විස්තරය	මුදල (රු.'000)
තක්සේරු වර්ෂයේ ව්‍යාපාරික ආදායම (ඉදිරියට ගෙනා හිලව් නොකල පාඩු අඩු කිරීමට පෙර)	490,000
අඩු කලා: ඉදිරියට ගෙනා ව්‍යාපාරික පාඩු ගැළපීම	(490,000)
ආයෝජන ආදායම	12,000
අඩු කලා: ඉදිරියට ගෙනා ව්‍යාපාරික පාඩු ගැළපීම	(12,000)
මුළු තක්සේරු කළ හැකි ආදායම	නැත

2026/2027 තක්සේරු වර්ෂය වෙත ඉදිරියට ගෙන යන ව්‍යාපාරික පාඩුව [526,000 – (490,000 +12,000)] =	**24,000**

2025/2026 තක්සේරු වර්ෂයේ සංඛ්‍යාලේඛන පදනම් කරගෙන, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා වන දළ ආදායම් බදු වගකීමේ ගණනය කිරීම පහත පරිදි වේ.

විස්තරය	**මුදල (රු.'000)**
2025/2026 තක්සේරු වර්ෂයේ ව්‍යාපාරික ආදායම (ඉදිරියට ගෙනා හිලව් නොකල පාඩු අඩු කිරීමට පෙර)	490,000
අඩු කලා: 2026/2027 තක්සේරු වර්ෂයේදී ගැළපීමට හැකි ඉදිරියට ගෙනා ව්‍යාපාරික පාඩුව	(24,000)
ව්‍යාපාරික ආදායම	466,000
ආයෝජන ආදායම	12,000
මුළු තක්සේරු කළ හැකි ආදායම	478,000
බදු අය කළ හැකි ආදායම	**478,000**
ගෙවිය යුතු දළ ආදායම් බද්ද රු 478,000 @ 30% = රු 143,400 මුළු දළ බද්ද = රු 143,400	

ඒ අනුව, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා ඉහත සූත්‍රයේ 'A' හි අගය රු 143,400,000 කි.

2026/2027 තක්සේරු වර්ෂය සඳහා සමාගමට රු 1,200,000 ක රඳවා ගැනීමේ බදු බැර (Withholding Tax Credits) හෝ අත්තිකාරම් ආදායම් බදු බැර (Advance Income Tax – AIT Credits) හිමිකම් තිබේ නම්, පළමු කාර්තුවේ වාරික ගෙවීම පහත පරිදි ගණනය කරනු ලැබේ.

$$\frac{A - C}{B} \qquad \frac{143,400,000 - 1,200,000}{4} = \text{රු. } 35,550,000$$

එබැවින්, ඒබීසී පුද්ගලික සමාගම 2026/2027 තක්සේරු වර්ෂය සඳහා වන පළමු කාර්තුමය වාරිකය ලෙස රු 35,550,000 ක් 2026 අගෝස්තු 15 දින හෝ එදිනට පෙර ගෙවිය යුතුය.

උදාහරණය 4: (ආයෝජන මණ්ඩල බදු නිදහස අවසන් වීම – එක්ස්වයිඉසෙඩ් පුද්ගලික සමාගම

2025/2026 තක්සේරු වර්ෂය සඳහා එක්ස්වයිඉසෙඩ් පුද්ගලික සමාගමේ බදු ගණනය කිරීම පහත පරිදි වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇති කරගත් ගිවිසුමට අනුව, මෙම සමාගම 2025/2026 තක්සේරු වර්ෂය දක්වා ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

විස්තරය	**මුදල (රු.'000)**

බදු නිදහස් ආදායම (ආයෝජන මණ්ඩල බදු නිදහස) – විදේශීය වෙළඳපොළ සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීමෙන් ලැබූ ලාභ හා ආදායම (විදේශ මුදලින් ආදායම බැංකුවට ලැබී ඇත)	44,000
මුළු තක්සේරු කළ හැකි ආදායම	නැත
බදු අය කළ හැකි ආදායම	නැත

2025/2026 තක්සේරු වර්ෂයේ සංඛ්‍යාලේඛන පදනම් කරගෙන, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා වන දළ ආදායම් බදු වගකීමේ ඇස්තමේන්තුගත ගණනය කිරීම පහත පරිදි වේ.

විස්තරය	**මුදල (රු.'000)**
ව්‍යාපාරික ආදායම – විදේශීය වෙළඳපොළ සඳහා මෘදුකාංග සංවර්ධනය කිරීමෙන් ලැබූ ලාභ හා ආදායම (විදේශ මුදලින් ආදායම බැංකුවට ලැබී ඇත)	44,000
මුළු තක්සේරු කළ හැකි ආදායම	44,000
බදු අය කළ හැකි ආදායම	**44,000**
ගෙවිය යුතු දළ ආදායම් බද්ද 44,000 @ 15% = 6,600 මුළු දළ බද්ද = 6,600	

ඒ අනුව, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා ඉහත සූත්‍රයේ 'A'හි අගය රු.6,600,000 කි.

ඒ අනුව, පළමු කාර්තු වාරික ගෙවීම පහත පරිදි ගණනය කරනු ලැබේ.

$$\frac{A - C}{B} \qquad \frac{6,600,000 - 0}{4} = \text{රු. } 1,650,000$$

එබැවින්, එක්ස්වයිඉසෙඩ් පුද්ගලික සමාගම 2026/2027 තක්සේරු වර්ෂය සඳහා වන පළමු කාර්තුමය වාරිකය ලෙස රු 1,650,000 ක් 2026 අගෝස්තු 15 දින හෝ එදිනට පෙර ගෙවිය යුතුය.

(ඈ) 2025/2026 තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායමක් පැවති නමුත් 2026/2027 තක්සේරු වර්ෂයේදී සැලකිය යුතු අඩුවීමක් අපේක්ෂා කරන අවස්ථා

යම් තැනැත්තෙකුට 2025/2026 තක්සේරු වර්ෂයේදී තක්සේරු කළ හැකි ආදායමක් තිබුණද, 2026/2027 තක්සේරු වර්ෂයේදී තක්සේරු කළ හැකි ආදායම සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කරන්නේ නම් (උදාහරණ ලෙස ව්‍යාපාරයේ සැලකිය යුතු පසුබෑමක්, වියදම් වැඩිවීමක් හෝ 2026/2027 තක්සේරු වර්ෂයේදී ආයෝජන අඩුවීමක් හේතුවෙන්), එවැනි තැනැත්තෙකුට 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද නැවත ගණනය කළ හැක.

මෙහිදී, 2026/2027 තක්සේරු වර්ෂයේදී ඇති නොවන බවට අපේක්ෂා කරන ව්‍යාපාර හෝ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ ලාභ හා ආදායම් එම ගණනයෙන් ඉවත් කළ යුතුය.

ඉහත (ආ) හා සමානවම, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා බදු ගණනය කිරීම පළමු වාරිකය ගෙවිය යුතු දිනය වන විට අවසන් කර නොමැති අවස්ථාවක, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා පළමු කාර්තුමය වාරිකය සඳහා ගෙවිය යුතු බද්ද ගණනය කිරීමේදී, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා වන අවසන් ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය (SET) භාවිත කළ හැක. කෙසේ වෙතත්, 2 වන කාර්තුමය වාරිකය සඳහා මෙය 2025/2026 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු වාර්තාව මත පදනම් වන පරිදි සංශෝධනය කළ යුතුය.

මෙම බදු ගෙවන්නන් ඇමුණුම 1 හි දක්වා ඇති පරිදි ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. පළමු කාර්තුව සඳහා SET පදනම භාවිත කළ බදු ගෙවන්නන්, පළමු කාර්තුව සඳහා ඇමුණුම 1 ද, දෙවන කාර්තුව සහ ඉන් පසු කාර්තු සඳහා ඇමුණුම 1 (සංශෝධිත) ද ඉදිරිපත් කළ යුතු අතර, එක් සංශෝධනයක් පමණක් සිදු කිරීමට අවසර ඇත.

තවද, මෙවැනි තැනැත්තන් විසින් ව්‍යාපාර හෝ ආයෝජනවල සිදු වූ/ සිදු වන පාඩු සනාථ කිරීම සඳහා අවශ්‍ය අදාළ ගණනය කිරීම් සහ අනෙකුත් උපකාරක තොරතුරු සමඟ ඇමුණුම 1 හි සඳහන් ආකාරයට ප්‍රකාශය ඉදිරිපත් කළ යුතුය.

යම් තැනැත්තෙකුට ව්‍යාපාර අලාභ හෝ නීතියෙන් අනුමත වෙනත් අඩුකිරීම් (Allowable Deductions) හේතුවෙන් වත්මන් තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායමක් නොමැති බව අපේක්ෂා කරන්නේ නම්, එම තත්ත්වය ඇමුනුම 1 ප්‍රකාශයෙහි 8.2 වගන්තිය යටතේ සඳහන් කළ යුතුය.

උදාහරණය 5 (ආදායම් අඩුවීම – යූවීඩබ්ලිව් පුද්ගලික සමාගම)

2025/2026 තක්සේරු වර්ෂය සඳහා යූවීඩබ්ලිව් පුද්ගලික සමාගමේ බදු ගණනය කිරීම පහත පරිදි වේ. තක්සේරු වර්ෂය තුළ, සමාගමට ඩීඩීඩී පුද්ගලික සමාගම සමඟ පවත්වාගෙන ගිය ව්‍යාපාරික කටයුතු අහිමි වී ඇත. 2025/2026 තක්සේරු වර්ෂයේදී සමාගම විසින් උපයාගත් ව්‍යාපාරික ආදායමෙන් 42%ක් එම සමාගමෙන් ලැබී ඇත. කෙසේ වෙතත්, සමාගමේ ව්‍යාපාරයට නව ගනුදෙනුකරුවෙකු එක් වී ඇති අතර, පෙර අලෙවි ප්‍රමාණයෙන් 15%ක් එම නව ගනුදෙනුකරු හරහා ලබාගත හැකි බව ඇස්තමේන්තු කර ඇත. තවද, සමාගම විසින් පොලී ආදායමෙන් 80%ක් උපයා ගත් ස්ථාවර තැන්පතු දෙකක් ඉවත් කරගෙන ඇත.

2025/2026 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වගකීම ගණනය කිරීම පහත පරිදි වේ.

විස්තරය	**මුදල (රු.'000)**
තක්සේරු වර්ෂයේ ව්‍යාපාරික ආදායම	636,000
අඩු කලා: ඉදිරියට ගෙනා ව්‍යාපාරික පාඩුව හිලව් කිරීම	(42,000)
ආයෝජන ආදායම	26,500
මුළු තක්සේරු කළ හැකි ආදායම	620,500
බදු අය කළ හැකි ආදායම	**620,500**
ගෙවිය යුතු දළ ආදායම් බද්ද 620,500 @ 30% = 186,150 මුළු දළ බද්ද = **186,150**	

2025/2026 තක්සේරු වර්ෂයේ සංඛ්‍යාලේඛන පදනම් කරගෙන, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා වන දළ ආදායම් බදු වගකීමේ ඇස්තමේන්තුගත ගණනය කිරීම පහත පරිදි වේ.

විස්තරය	**මුදල (රු.'000)**
තක්සේරු වර්ෂයේ ව්‍යාපාරික ආදායම (ශුද්ධ ව්‍යාපාර අඩුවීම 27%ක් ගැළපූ පසු)	464,280
අඩු කලා: ඉදිරියට ගෙනා ව්‍යාපාරික පාඩුව හිලව් කිරීම	(42,000)
ආයෝජන ආදායම (ශුද්ධ ආයෝජන අඩුවීම 80% ගැළපූ පසු)	5,300
මුළු තක්සේරු කළ හැකි ආදායම (නැවත තක්සේරු කරන ලද)	427,580
බදු අය කළ හැකි ආදායම	**427,580**
ගෙවිය යුතු දළ ආදායම් බද්ද 427,580 @ 30% = 128,274 මුළු දළ බද්ද = **128,274**	

ඒ අනුව, ඉහත සූත්‍රයේ 'A' අගය රු. 128,274,000 ක් වේ. 2026/2027 තක්සේරු වර්ෂය සඳහා සමාගමට රඳවා ගැනීමේ බදු බැර (Withholding Tax Credits) හෝ අත්තිකාරම් ආදායම් බදු බැර (Advance Income Tax – AIT Credits) හිමිකමක් නැති නම්, පළමු කාර්තුවේ වාරික ගෙවීම පහත පරිදි ගණනය කරනු ලැබේ.

$$\frac{A - C}{B} \qquad \frac{128{,}274{,}000 - 0}{4} = \text{රු. } 32{,}068{,}500$$

එබැවින්, යූවීඩබ්ලිව් පුද්ගලික සමාගමේ 2026/2027 තක්සේරු වර්ෂය සඳහා පළමු කාර්තුමය බදු වාරිකය ලෙස රු. 32,068,500 ක් 2026 අගෝස්තු 15 දින හෝ එදිනට පෙර ගෙවිය යුතුය.

(ඇ) අලුතින් ලියාපදිංචි වූ බදු ගෙවන්නන්

මෙම තැනැත්තන්ට පෙරාතුවම තක්සේරු වර්ෂය සඳහා බදු ගණනයක් නොමැති බැවින්, වත්මන් තක්සේරු වර්ෂය සඳහා තම බදු අය කළ හැකි ආදායම ඇස්තමේන්තු කර ගණනය කළ යුතුය. එම ගණනය සඳහා වත්මන් තක්සේරු වර්ෂයට අදාළ බදු නීතිය හා බදු අනුපාත භාවිතා කළ යුතුය.

මෙම විධිවිධාන අදාළ වන්නේ බදු ගෙවන්නෙකුගේ පළමු තක්සේරු වර්ෂයට පමණි. ඊළඟ තක්සේරු වර්ෂවලදී, ඉහත සඳහන් සුදුසු ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය.

මෙම පුද්ගලයන් ඇමුණුම 2 හි දක්වා ඇති ආකෘතියට අනුව ප්‍රකාශයක් ද ඉදිරිපත් කළ යුතුය.

තෙවැනි ක්‍රමය 3: ඇස්තමේන්තු කිරීමට නොහැකි බදු ගෙවන්නන්

දෙවැනි ක්‍රමයේ (ආ) හෝ (ඇ) පදනම් අනුව "A" අගය ගණනය කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි බදු ගෙවන්නෙකු (විශේෂ හේතු මත), ඒ සඳහා බලපාන සාධාරණ හේතු සහ සීමාවන් විස්තර කරමින්

බදු ප්‍රතිපත්ති සහ නීති සම්පාදන අංශයේ කොමසාරිස්වරයා (කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන්) වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

3. සාමාන්‍ය පරිපාලන නීති සහ විශේෂ පැහැදිලි කිරීම්

3.1 බදු බැර උපලේඛණ (credit schedules)

ඉහත විධිවිධාන අදාළ වන්නේ සූත්‍රයේ "A" අගය ගණනය කිරීමට පමණි. "B" සහ "C" සංරචකවල කිසිදු වෙනසක් නොමැති බැවින්, නියමිත ආකෘතියට අනුව බදු බැර උපලේඛණ (Credit Schedule) ඉදිරිපත් කළ යුතුය.

බදු බැර උපලේඛණ අදාළ කාර්තු වාරිකය ගෙවිය යුතු මාසයේ අවසාන දිනයට හෝ ඊට පෙර (එනම්, අගෝස්තු 31, නොවැම්බර් 30, පෙබරවාරි 28 හෝ 29 සහ මැයි 31 යන දිනවලට හෝ ඊට පෙර) මධ්‍යම ලේඛන කළමනාකරණ අංශය (CDMU) හෝ නගර බද සහ ප්‍රාදේශීය කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුය.

3.2 සේවා නියුක්ති ආදායම

දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව, වාරික වශයෙන් බදු ගෙවන පුද්ගලයෙකුගේ ගෙවිය යුතු බද්ද ගණනය කිරීමේදී, සේවා යෝජකයා විසින් එම තක්සේරු වර්ෂය සඳහා අඩු කර ඇති හෝ අඩු කිරීමට අපේක්ෂිත අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (Advance Personal Income Tax -APIT) ප්‍රමාණය ඉහත සඳහන් සූත්‍රය භාවිතයට පෙර අඩු කළ හැකිය.
(අ) එබැවින්, පුද්ගලයෙකුට සේවා නියුක්ති ආදායම පමණක් ලැබෙන වටෙක එම ආදායම අත්තිකාරම් පුද්ගල ආදායම් බදු යටතේ බදු අඩු කිරීමකට ලක්වන්නේ නම්, ඔහුට හෝ ඇයට කාර්තුමය බදු වාරික ගෙවීමේ අවශ්‍යතාවක් නොමැති අතර, ඉහත සඳහන් බදු බැර උපලේඛණ (Credit Schedule) ද ඉදිරිපත් කළ යුතු නොවේ.

(ආ) පුද්ගලයෙකුට සේවා නියුක්ති ආදායමට අමතරව, අත්තිකාරම් ආදායම් බදු (Advance Income Tax -AIT) යටතේ බදු අඩු කරන කුලී ආදායමක් හෝ පොලී ආදායමක්ද ලැබේ නම්, සහ එම අත්තිකාරම් ආදායම් බදු ප්‍රමාණය වත්මන් බදු තක්සේරු වර්ෂය සඳහා ඉතිරි බදු වගකීම සම්පූර්ණයෙන් ආවරණය කිරීමට ප්‍රමාණවත් නම්, එම පුද්ගලයාටද කාර්තුමය බදු වාරික ගෙවීමට හෝ බදු බැර උපලේඛණ (Credit Schedule) ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවේ.

මෙම විධිවිධාන අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වගු 8 (APIT Table 8) අනුව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කර ගෙවනු ලබන සේවකයන්ටද අදාල වේ.

උදාහරණය 6: පී මහත්මියගේ 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ආදායම් විස්තර සහ 2026/2027 තක්සේරු වර්ෂය සඳහා ඇයගේ ඇස්තමේන්තුගත ආදායම් විස්තර පහත පරිදි වේ:

	2025/2026 (රු)	2026/2027 (රු) (ඇස්තමේන්තුගත)
සේවා නියුක්ති ආදායම	5,000,000	5,800,000
පොලී ආදායම	1,000,000	900,000

මුළු තක්සේරු කළ හැකි ආදායම		6,000,000	6,700,000
අඩු කලා: පුද්ගලික සහනය		1,800,000	1,800,000
බදු අය කළ හැකි ආදායම		4,200,000	4,900,000
ගෙවිය යුතු දළ ආදායම් බද්ද	පළමු රු. 1,000,000 @ 6% = 60,000 ඊළඟ රු. 500,000 @ 18% = 90,000 ඊළඟ රු. 500,000 @ 24% = 120,000 ඊළඟ රු. 500,000 @ 30% = 150,000 ඉතිරිය රු.1,700,000 @ 36% =612,000 දළ ආදායම් බද්ද =රු. 1,032,000		

ඒ අනුව, ඉහත සූත්‍රයේ 'A' හි අගය රු. 1,032,000 වේ. 2026/2027 තක්සේරු වර්ෂය සඳහා පී මහත්මිය වෙත ලබාගත හැකි අත්තිකාරම් පුද්ගල ආදායම් බදු බැර රු. 960,000ක් සහ අත්තිකාරම් ආදායම් බදු බැර රු. 90,000ක් (එනම්, තක්සේරු වර්ෂය තුළ දැනටමත් අඩු කර ඇති සහ අඩු කිරීමට නියමිත අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ අත්තිකාරම් ආදායම් බදු) එකතුව රු. 1,050,000ක් වන බැවින්, ඇය විසින් කිසිදු කාර්තු වාරික ගෙවීමක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

3.3 විදේශීය බදු බැර (Foreign Tax Credits)

තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්ද (සූත්‍රයේ "A" අගය) ඇස්තමේන්තු කිරීමේදී, දේශීය ආදායම් පනතේ 80 වන වගන්තිය යටතේ හිමිවන විදේශීය බදු බැර සැලකිල්ලට ගත හැකිය. එහෙත්, විදේශීය බදු බැර සලකා බැලිය හැක්කේ එය දැනටමත් ගෙවා ඇතිනම් හෝ එම වර්ෂය තුළ ගෙවන බවට සාධාරණ ලෙස අපේක්ෂා කරන අවස්ථාවලදී පමණි.

3.4 විකල්ප ගිණුම් කාලපරිච්ඡේද

කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය මත, යම් තැනැත්තෙකු ආදායම් බද්ද ගණනය කිරීම සඳහා විකල්ප මාස 12ක ගිණුම් කාලයක් භාවිතා කලද, මෙම චක්‍රලේඛයේ විධිවිධාන කිසිදු වෙනසක් නොමැතිව එලෙසම අදාළ වේ.

3.5 ඉදිරිපත් කිරීමේ අවසාන දිනය

මෙම චක්‍රලේඛය යටතේ අවශ්‍ය වන ඇමුණුම් 2026 නොවැම්බර් 30 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා සකස් කරන ලද ඇමුණුම්, 2025/2026 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු වාර්තා ඉදිරිපත් කරන අවස්ථාවේදී උඩුගත කළ හැක.
බදු ගෙවන්නන්ට ආදායම් බදු වාර්තා ගොනු කිරීමේදී "Upload Supporting Documents → Supporting Documents → Other Relevant Documents" යන මාර්ගය යටතේ අදාළ ඇමුණුම් RAMIS පද්ධතියට උඩුගත කළ හැක. ගොනුව "TIN_2627_INSAttachment1" ලෙස නම් කළ යුතුය උදාහරණය = 111122222_2627_INSAttachement1). අදාළ අවස්ථාවලදී, නම "INSAttachment1_Revised" හෝ "INSAttachment2" ලෙස, සුදුසු පරිදි වෙනස් කළ යුතුය. අදාළ අවස්ථාවලදී, ඇමුණුම 1 සහ ඇමුණුම 1 (සංශෝධිත) යන දෙකම එකම දිනයේ ඉදිරිපත් කළ හැක.

මුද්‍රිත ලේඛන ඉදිරිපත් කිරීමට අපේක්ෂිත බදු ගෙවන්නන්ට ඒවා මධ්‍යම ලේඛන කළමනාකරණ අංශය (CDMU) හෝ නගර බද සහ ප්‍රාදේශීය කාර්යාල වෙත ඉදිරිපත් කළ හැක.

www.ird.gov.lk https://www.facebook.com/irdcolsl/

3.6 වර්ෂය මැද සංශෝධන ඉල්ලීම්

මෙම චක්‍රලේඛයේ පලමු ක්‍රමය (සම්මත පදනම) යටතේ කාර්තු වාරික ගෙවමින් සිටින බදු ගෙවන්නෙකුට, 2026/2027 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බදු අය කළ හැකි ආදායම 2025/2026 තක්සේරු වර්ෂයේ ආදායමට වඩා අඩු වන බව ඉදිරියේ දී පෙනීයයි නම්, අදාළ කාර්තු වාරිකය ගෙවිය යුතු දිනට පෙර මාසයේ අවසාන දිනයට හෝ ඊට පෙර (එනම්, ඔක්තෝබර් 31, ජනවාරි 31 හෝ අප්‍රේල් 30) ගණනය කිරීමේ පදනම සංශෝධනය කිරීම සඳහා දැනුම් දීමක් ඉදිරිපත් කළ හැකිය. එම දැනුම් දීම අදාළ අවසන් දිනයට හෝ ඊට පෙර උපකාරක තොරතුරු සමඟ මධ්‍යම ලේඛන කළමනාකරණ අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, අදාළ අවස්ථාව අනුව බදු ගෙවන්නාට දෙවැනි ක්‍රමය හෝ තෙවැනි ක්‍රමය 3 භාවිතා කළ හැකිය.

රුක්දේවි පී. එච්. ප්‍රනාන්දු
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

රුක්දේවි පී.එච්. ප්‍රනාන්දු
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ 02.

www.ird.gov.lk https://www.facebook.com/irdcolsl/

ඇමුණුම 1 – මුල් / සංශෝධිත

ආකෘති පත්‍ර අංක: SEC/2026/SA/01

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

අනුක්‍රමික අංකය	අංශය/ප්‍රා. කා	නිලධාරියා

වාරික වශයෙන් ගෙවිය යුතු / නොගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය පිළිබඳ ප්‍රකාශය

තක්සේරු වර්ෂය: ....

1. **බදු ගෙවන්නාගේ නම:**..

....

2. **බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය:** ....

3. **ලිපිනය:** ....

....

4. **බදු ගෙවන්නාගේ තත්වය:** තනිපුද්ගල / හවුල් ව්‍යාපාර / සමාගම් (ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද) / රාජ්‍ය සංස්ථා / භාර / ඒකක භාර හෝඅන්‍යෝන්‍ය අරමුදල් / පුණ්‍යායතන / රාජ්‍ය නොවන සංවිධාන / සේවා නියුක්තයන්ගේ භාර අරමුදල / සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල / විශ්‍රාම වැටුප් අරමුදල / සේවා නියුක්තයන්ගේ සමාපන අරමුදල / සේවා නියුක්තයන්ගේ පාරිතෝෂික අරමුදල / වෙනත් අරමුදලක් / වෙනත් (කරුණාකර සඳහන් කරන්න) ....

5. **අදාළ තක්සේරු වර්ෂය සඳහා වාසිකයකු ද නිර්වාසිකයකු ද යන වග:**

....

6. **ඉදිරියට ගෙනා හිලව් නොකළ පාඩු (රු.)**

තක්සේරු වර්ෂය	ව්‍යාපාර පාඩු	ආයෝජන පාඩු	එකතුව

7. පසුගිය තක්සේරු වර්ෂ / වර්ෂය සඳහා හිමිකම් පෑම් ඉදිරිපත් කළ ආදායම් බදු නිදහස් කිරීම්, ඒවායේ මුදල් ප්‍රමාණ සමග (රු.)

....

....

....

....

(ආදායම් බදු නිදහස් කිරීම, අදාළ නීතිය/ගිවිසුම් විස්තර සමග පැහැදිලි කරන්න.)

8. 8.1 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද තක්සේරු කළ හැකි ආදායම (පාඩු අඩු කළ පසුව) ** යම් පාඩුවක් ගළපන්නේ නම්, වෙනම ගණනය කිරීමක් ඇමිණිය යුතු ය.

යොදාගත් පදනම: 2025/2026 තක්සේරු වර්ෂයේ ආදායම් බදු වාර්තාවේ පදනම / පෙර වර්ෂයේ ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශයේ (SET) පදනම (යොදාගත් පදනම තෝරන්න)

(රු.)

තක්සේරු වර්ෂය	සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම	ව්‍යාපාර ආදායම	ආයෝජන ආදායම	වෙනත් ආදායම්	එකතුව
බදු අය කළ හැකි ආදායම					
ගෙවිය යුතු දළ බදු මුදල					

8.2 තක්සේරු වර්ෂය තුළ අපේක්ෂිත අලාභ / අවසර ලත් අඩු කිරීම් (තක්සේරු කළ හැකි ආදායමක් නොමැති අවස්ථාවක)

රු.

තක්සේරු වර්ෂය	ව්‍යාපාරයෙන් සිදු වූ පාඩුව	ආයෝජනයෙන් සිදු වූ පාඩුව	විශේෂ අඩු කිරීම් *(උදා: සුදුසුකම් ලබන ගෙවීම් වැනි)*	එකතුව

** තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද පාඩුව ගණනය කිරීම පිළිබඳ විස්තර අමුණන්න.

9. ප්‍රකාශය

මෙම ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කර ඇති සියලුම විස්තර මා දන්නා පරිදි සහ මාගේ විශ්වාසය පරිදි නිවැරදි සහ සම්පූර්ණ බව ප්‍රකාශ කරමි. සාවද්‍ය හෝ අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම හෝ අසත්‍ය තොරතුරු ලබා දීම වරදක් බව දනිමි.

ප්‍රකාශකගේ සම්පූර්ණ නම: ....

....

තනතුරු නාමය: ....

(තනි පුද්ගල / හවුල්කරු / කළමනාකාර අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ / ලේකම් / ප්‍රධාන නිලධරයා / නිසි බලයලත් අනුයෝජිතයා)

දුරකථන අංකය: කාර්යාලය .... **ජංගම:** ....

විද්‍යුත් තැපැල : ....

අත්සන: **නිල මුද්‍රාව:**

ජා.හැ.අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය:

ඇමුනුම 2

ආකෘති පත්‍ර අංක} SEC/2026/SA/02

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

අනුක්‍රමික අංකය	අංශය / ප්‍රා. කා.	නිලධාරියා

වාරික වශයෙන් ගෙවිය යුතු / නොගෙවිය යුතු බදු මුදල් ප්‍රමාණය පිළිබඳ ප්‍රකාශය
තක්සේරු වර්ෂය: ....

1. **බදු ගෙවන්නාගේ නම**: ....
....

2. **බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය:** ....

3. **ලිපිනය**: ....
....

4. **බදු ගෙවන්නාගේ තත්වය :** තනිපුද්ගල / හවුල් ව්‍යාපාර / සමාගම් (ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද) / රාජ්‍ය සංස්ථා / භාර / ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදල් / පුණ්‍ය ආයතන / රාජ්‍ය නොවන සංවිධාන / සේවා නියුක්තයන්ගේ භාර අරමුදල / සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල / විශ්‍රාම වැටුප් අරමුදල / සේවා නියුක්තයන්ගේ සමාපන අරමුදල / සේවා නියුක්තයන්ගේ පාරිතෝෂික අරමුදල / වෙනත් අරමුදලක් / වෙනත් (කරුණාකර සඳහන් කරන්න) ....

5. **අදාළ තක්සේරු වර්ෂය සඳහා වාසිකයකු ද නිර්වාසිකයකු ද යන වග**:

....

6. **6.1 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද තක්සේරු කළ හැකි ආදායම (පාඩු අඩු කළ පසුව) ** යම් පාඩු ගැලපීමක් සිදු කරන්නේ නම්, වෙනම ගණනය කිරීමක් ඇමිණිය යුතු ය.**

රු.

තක්සේරු වර්ෂය	සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම	ව්‍යාපාර ආදායම	ආයෝජන ආදායම	වෙනත් ආදායම්	එකතුව

බදු අය කළ හැකි ආදායම	
ගෙවිය යුතු දළ බදු මුදල	

6.2 තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද පාඩුව (තක්සේරු කළ හැකි ආදායමක් නොමැති නම්)

රු.

තක්සේරු වර්ෂය	**ව්‍යාපාරයෙන් සිදු වූ පාඩුව**	**ආයෝජනයෙන් සිදු වූ පාඩුව**	**එකතුව**

** තක්සේරු වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද පාඩුව ගණනය කිරීම පිළිබඳ විස්තර අමුණන්න.

7. ප්‍රකාශය

මෙම ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කර ඇති සියලුම විස්තර මා දන්නා පරිදි සහ මාගේ විශ්වාසය පරිදි නිවැරදි සහ සම්පූර්ණ බව ප්‍රකාශ කරමි. සාවද්‍ය හෝ අසත්‍ය ප්‍රකාශයක් සිදු කිරීම හෝ අසත්‍ය තොරතුරු ලබා දීම වරදක් බව දනිමි.

ප්‍රකාශකගේ සම්පූර්ණ නම: ....

....

තනතුරු නාමය: ....

(තනි පුද්ගල / හවුල්කරු / කළමනාකාර අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ / ලේකම් / ප්‍රධාන නිලධරයා / නිසි බලයලත් අනුයෝජිතයා)

දුරකථන අංකය: **කාර්යාලය** .... **ජංගම**: ....

විද්‍යුත් තැපැල: ....

අත්සන: **නිල මුද්‍රාව**:

ජා.හැ.අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය: